# රුවන්වැලි සෑය හා දළදා මැඳුර

රුවන්වැලි සෑය තැනීමෙන් පසු මෙරට සියල්ලන් බෞද්ධ වී යැයි මෙයින් නො කියැවෙයි. මෙරට කිසිම දිනෙක සියල්ලන් බෞද්ධ වී යැයි අපි නො කියමු. ඒ ඒ අයගේ ආගම ඒ ඒ අයට අවශ්‍ය පරිදි ඇදහීමට මෙරට කිසිම බාධාවක් තිබෙන්නට නො හැකි ය. එසේ වීම බෞද්ධ සංස්කෘතියකට එකඟ නො වෙයි. රුවන්වැලි සෑය මහා සෑය බවට පත්වුයේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රධානත්වය අද මෙන් ම එදා ද පිළිබිඹු කෙරුණු සෑය ඒ වු බැවිනි.

සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රධාන වස්තූන් වනුයේ ශ්‍රී මහා බෝධිය හා දළදා වහන්සේ යැයි කිව හැකි ය. රුවන්වැලි සෑය ඇතුළු චෛත්‍ය ඉන් වෙනස්වන්නේ ඒ සිංහලයන් විසින් නිර්මාණය කරනු ලැබූ බැවිනි. දළදා වහන්සේ වඩා සිඳුවීම සඳහා දළදා මන්දිරයක් අවශ්‍ය බව ද මන්දිරය සිංහලයන්ගේ නිර්මාණයක් බව ද සැබෑ ය. එහෙත් සිංහල බෞද්ධයන් වඳින්නට යන්නේ දන්ත ධාතූන් වහන්සේ මිස සෑයක් හෝ මන්දිරයක් හෝ නො වෙයි.

චෛත්‍යයක් වැඳීමට යෑමේ දී සිංහල බෞද්ධයන්ට එහි නිදන් කර ඇත්තේ කිනම් ධාතූන් වහන්සේ නමක් ද යන්න මතක් වන්නේ යැයි නො සිතමි. රුවන්වැලි සෑයේ නිදන්කර ඇත්තේ කිනම් ධාතූන්වහන්සේ නමක්දැයි දන්නා සිංහල බෞද්ධයෝ කොතෙක් වෙත් ද? එහෙත් ඒ සෑය ඉදිකෙළේ කිනම් රජ කෙනකුගේ මූලිකත්වයෙන් දැයි සිංහල බෞද්ධයෝ සියල්ලෝම පාහේ දනිති. අනෙක් අතට දළදා මන්දිරය කරවන ලද්දේ කවුරුන් විසින් දැයි නොදන්නා නමුදු එහි දළදා හාමුදුරුවන් වැඩ වසන බව කවුරුත් පාහේ දනිති.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙන් ම දන්ත ධාතූන් වහන්සේ ද සිංහල බෞද්ධයන් සම්බන්ධයෙන් ගත්කල කිසිම රජතුමකු හෝ වෙනත් ගිහියකු හා සම්බන්ධ නො වෙති. එහෙත් සෑම චෛත්‍යයක ම බුදුන් වහන්සේගේ ධාතූන් වහන්සේ නමක් නිදන්කර ඇතැයි සැලකුව ද සිංහල බෞද්ධයනට චෛත්‍යය කරවූ තැනැත්තා වැදගත් වෙයි. චෛත්‍ය කිසියම් ක්‍රමයකින් හෝ ඒ නිර්මාණය කිරීම හා සම්බන්ධ ය.

රුවන්වැලි සෑය මහා සෑය වන්නේ සිංහලයන් විසින් නිර්මාණය කරන ලද එවැනි චෛත්‍ය අතරින් සිංහල බෞද්ධ සංස්කෘතිය හා සම්බන්ධයෙන් ගත්කල ඒ ප්‍රධාන වන බැවිනි. මෙරට සිංහල බෞද්ධ රාජ්‍යය පිහිටුවීමේ සංකේතය රුවන්වැලි සෑය වෙයි. එබැවින් ඒ සිංහල බෞද්ධයනට වැදගත් ය. එබැවින් මහවංශය ලියූ මහානාම හිමියන්ට ඒ වැදගත් විය. අනුකාරක උගතකු අනෙක් චෛත්‍යවලට වඩා විශේෂ තැනක් රුවන්වැලි සෑයට මහාවංශයේ දී ඇත්තේ ඇයි දැයි ප්‍රශ්න කරන විට ඒ ඇංකර උගත් තැනැත්තා හෝ තැනැත්තිය හෝ සිංහල බෞද්ධ සංස්කෘතිය නොදන්නා බව පැහැදිලි වෙයි.

රුවන්වැලි සෑය ඉදිකිරීමෙන් පසුව ද මෙරට වෙනත් ආගම් ඇදහූ අය යම් ප්‍රමාණයක් හෝ සිටිය හ. ඒ සඳහා හොඳම උදාහරණය වළගම්බා රජු පළමුවරට යුද්ධයෙන් පැරදී පළා යන විට ගිරි නම් නිගණ්ඨයකු මහා කළු සිංහලයා පළා යන්නේ යැයි කී කතාව ය. ඉන් කියැවෙන්නේ එකල මෙරට ජෛනයන් සිටි බව හා ඔවුන්ගේ සිද්ධස්ථාන මෙහි තිබූ බව ය. වළගම්බා රජු පසුව යුද්ධයෙන් දිනා නැවත රට එක්සේසත් කිරීමෙන් පසු ගිරි නම් නිගණ්ඨයා සිටි තැන අභයගිරිය කරවී ය. අභයගිරිය නම් කිරීමේ දී රජතුමා තමාගේ නමක් වූ අභය හා ගිරි නම් නිගණ්ඨයාගේ නම් එකතුකළ බව කියැවෙයි.

ඇතැමකුට අනුව එතැන කුඩා කන්දක් තිබූ බැවින් ඒ ගිරි විය. සමහර විට මේ කරුණු දෙකම සිදු වුවා විය හැකි ය. එතැන කන්දක්, කඳු ගැටයක් තිබිණි නම් ඒ ස්ථානය සමහර විට ගිරිය නමින් හැඳින්වෙන්නට ඇත. මෙහි දී ඇතැමුන් උදාහරණයට ගෙනෙන්නේ ගිරග්ග සමජ්ජ උත්සවය ය. කන්දක පවත්වන ලද සමාජ උත්සවයක් යන තේරුමින් ඒ ගිරග්ග සමජ්ජ වී යැයි කියැවෙයි. කන්දේ සිද්ධස්ථානයක් තනාගෙන සිටි නිගණ්ඨයා ගිරි නිගණ්ඨයා යනුවෙන් හඳුන්වනු ලැබීම සිංහල සංස්කෘතියට එකඟ ය. කෙසේ හෝ වේවා අභයගිරිය යන නමෙහි ඉතිහාසය ද යම් පමණකින් හෝ ගැබ් වී ඇත.

© Prof. Nalin De Silva

ඒ ගිරි නිගණ්ඨාරාමයෙහි ජෛනයන් සිටි බව ඉතිහාසයෙහි සඳහන් ය. වළගම්බා රජුට පෙර සිටි බල්ලාටනාග රජු මැරීමට කුමන්ත්‍රණය කළ සහෝදරවරු තිදෙනා ගිරි නිඝණ්ඨාරාමයෙන් පැමිණි බව සඳහන් ය. මෙයින් පැහැදිළි වන්නේ ගැමුණු රජතුමාගෙන් පසුවත් විවිධ ආගමිකයන් මෙරට සිටි බව ය. එහෙත් මේ ආගමිවලට ගිය අය නොබෝ කලකින් ම කළකිරීමට පත්වූහ. මේ නව ආගමිකයන් හරිහැටි සිංහල සමාජය නොදැන සිටින්නට ඇත. එමෙන් ම ඔවුන් පොදුවේ ගත්කල සිංහල බෞද්ධයනට විරුද්ධ වූ බව ද කියැවෙයි. එකල සිංහල බෞද්ධයන් පමණක් නොව සිංහල ජෛනයන් ද සිටි බව පැහැදිලි ය. තමන් පිටුපස ජෛන පූජකයන් සිටි බව සිංහල ජෛනයන් දැන සිටි ඔව ද පැහැදිලි ය.

එකල පමණක් නොව ඉන් පෙර පණ්ඩුකාභය සමයෙහි ද මෙරට ජෛනයන් වාසය කර ඇත. පණ්ඩුකාභය රජතුමාගේ අනුරාධපුර නගර සංවර්ධන සැලැස්මේ ජෛන සිද්ධස්ථාන ගැන කියැවෙයි. එහෙත් මේ ලේඛනවලින් කියැවෙන අනෙක් කරුණ නම් එකල සිටි ජෛනයන් සංඛ්‍යාව එතරම් විශාල නොවන බව ය. සෙල්ලිපිවල ජෛනයන් ගැන හෝ ජෛන සිද්ධස්ථාන ගැන හෝ එතරම් යමක් නො කියැවෙයි.

ජෛනයෝ වෙළෙන්දෝ වූහ. ජෛන ආගමේ ඉගැන්වෙන පරම අවිහිංසාව හේතුවෙන් ජෛනයන්ට ගොවිතැන් කිරීමට නො හැකි විය. ඒ ගොවිතැන් කිරීමේ දී පොළොව කෙටීමේ දී සතුන්ට හිරිහැරවීම හෝ සතුන් මියයෑම හෝ සිදුවන බැවිනි. පැහැදිලිව ම ජෛන ආගමෙහි සිත ගැන එතරම් අධ්‍යයනයක් කෙරී නැත. අප ඇවිදිද්දී හෝ වෙනත් වැඩක් කිරීමේ දී හෝ අප නොසිතාම සතකු මිය යන්නේ නම් අපට කළහැකි දෙයක් නැත. ඇවිදීම අත්හැර ජීවත්වීමට නො හැකි ය.

අවිඥානිකව සිදුවන ක්‍රියා සම්බන්ධයෙන් අප වග කිව යුතු නොවන බව ජෛනයන්ට වටහා ගැනීමට නොහැකි වී ඇති බව පැහැදිලි ය. ඒ කෙසේ වෙතත් ජෛනයන්ට ඔවුන්ගේ ආගමෙහි කියැවෙන අයුරින් ජීවත්වීමට යෝග්‍ය ම වෘත්තිය වෙළෙඳාම විය. අද පවා ඉන්දියාවේ ජෛනයන් බහුලව ඇත්තේ වෙළෙන්දන් අතර ය. ලංකාවේ, එනම් එදා හෙළයේ (සිංහල දේශයේ) වෙළෙන්දෝ බොහෝ විට නාග ගෝත්‍රිකයෝ වූහ. නාගයෝ වෙළෙන්දෝ මෙන් ම නාවිකයෝ ද වූහ. එකල මේ වෘත්තීන් දෙක අතර යම් බැඳීමක් තිබූ බව පෙනී යයි.

මෙරට නාගයෝ බුදුන් වහන්සේගෙන් පසුව බෞද්ධයෝ වූහ. චූලොදෝර මහොදර යුද්ධයෙන් මෙන් ම මණිඅක්ඛික නාග රාජයාගේ කතාවෙන් ද පෙනී යන්නේ නාගයන් බෞද්ධයන් වීමට දැක්වූ දැඩි කැමැත්ත ය. එමෙන් ම ගැමුණු රජුට ද නාග සම්බන්ධයක් විය. බල්ලාටනාග රජු ගෝත්‍රික නාමයෙන් ම පෙනී සිටියේ ය. ඒ රජු මැරීමට කුමණ්ත්‍රණය කළෝ ජෛනයෝ යැයි සිතිය හැකි ය. වෙළෙන්දන් බෞද්ධයන් වූ පසු ජෛන ආගමට මෙරට එතරම් ඉල්ලුමක් නො වී ය. කෘෂිකර්මය බෞද්ධයන්ට අකැප දෙයක් නො වී ය.

මෙකල ලංකාවේ පමණක් නොව භාරතයේ ද හින්දු ආගමක් නො වී ය. හින්දු ආගම භාරතයේ ද ඇතිවූයේ සංකරාචාර්යවරයාගෙන් පසුව ය. ඔහු බුදු දහම වෛදික දහම තුළට ගෙන අද්වෛත වේදාන්තය නිර්මාණය කෙළේ ය. භාරතය හින්දු වූයේ ඉන් පසුව ය. මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. හින්දු ආගමේ අද දක්නට ඇති අවිහිංසාව බුදු දහමෙහි හා ජෛන ආගමෙහි අවිහිංසාව නිසා ඇතිවිණි. බුදු දහමෙහි අවිහිංසාව ජෛන ආගමෙහි පරම අවිහිංසාව මෙන් නොවූවත් වෛදිකයන්ට අවිහිංසාව තම ආගමට ඇතුළත් කරගැනීමට සිදුවූයේ ඒ ආගම් හේතුවෙනි.

වෛදිකයෝ බලි පූජා සඳහා සතුන් මැරූහ. එහෙත් හින්දු ආගමට හිංසාවට විරුද්ධ ය. හින්දු ආගම යනු වෛදික සංස්කෘතියට බුදු දහම හා යම් ප්‍රමාණයකට ජෛන ආගම අවශෝෂණය කරගැනීමෙන් බිහිවූවකි. ආර්ය සංස්කෘතිය දඹදිව ආක්‍රමණය කිරීමෙන් පසුව ඒ සංස්කෘතියට ක්‍රමයෙන් දඹදිව තිබූ අනාර්ය සංස්කෘතික ලක්ෂණ අවශෝෂණය කෙරිණි. සියවස් ගණනාවක් ඇවෑමෙන් ඒ ක්‍රියාදාමය පරිපූර්ණත්වයට පත්වූයේ හින්දු ආගම ඇතිවීමෙන් පසුව ය. ඉන් පසුව එලෙස බිහිවූ හින්දු සංස්කෘතියට නැවතත් භාරතයට බටහිරින් පැමිණි මුස්ලිම් සංස්කෘතිය අවශෝෂණය කෙරිණි. අද පවත්නා භාරතීය සංස්කෘතිය මේ සියල්ලෙහි ප්‍රතිඵලයකි.

© Prof. Nalin De Silva

මෙයින් පැහැදිලි වන්නේ හින්දු ආගම බුදු දහම බිහිවීමෙන් පසුව නිර්මාණය වූ බව ය. එහෙත් අද සම්මත මතය වී ඇත්තේ බුදු දහම හින්දු ආගමෙන් බිහිවූවක් බව ය. අද ඉන්දියාවේ වාසය කරන පඬිවරු මේ මතය තදින් ප්‍රචාරය කරති. ඉන්දියාවේ ජනාධිපති ව සිටි, එමෙන් ම දාර්ශනිකයකු ලෙස නමක් දිනාගෙන සිටි සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් මහතාට  අනුව සිදුහත් කුමරු හින්දු ආගමිකයකු ලෙස උපත ලබා හින්දු ආගමිකයකු ලෙස ජීවත් වී හින්දු ආගමිකයකු ලෙස මියගියේ ය. රාධක්‍රිෂ්ණන් මහතා මෙන් ම අද ඉන්දියාවේ ජීවත්වන පඬිවරු ද හින්දු ආගම හා වෛදික ආගම්  අතර වෙනසක් නොදකින බව පැහැදිලි ය.

අප අපේ ප්‍රවාද මඟින් කියා ඇත්තේ ආර්ය සංස්කෘතිය දඹදිවට පැමිණෙන විට එහි තිබූ අනාර්ය සංස්කෘතිය සමග මිශ්‍ර වී වෛදික සංස්කෘතිය  නිර්මාණය කිරීමට සියවස් ගණනාවක් ගිය බව ය. ආර්ය සංස්කෘතිය එතරම් තදින් පැතිර යෑමට පෙර වූ මිශ්‍රණයට අපි අර්ධ වෛදික සංස්කෘතිය යැයි කීවෙමු. අපට තවත් ආකාරයකින් මේ සංස්කෘතික විපර්යාසය තේරුම් ගත හැකි ය. අර්ධ වෛදික සංස්කෘතිය යනු අනාර්ය සංස්කෘතියට ආර්ය සංස්කෘතිය (එනම් එහි අංග) අවශෝෂණය කිරීමෙන් බිහිවූවකි. වෛදික සංස්කෘතිය යනු මේ අවශෝෂණය පිටාර හලා ආර්ය සංස්කෘතියට අනාර්ය සංස්කෘතිකාංග අවශෝෂණය කිරීමෙන් බිහිවූවකි. සිදුහත් කුමරු බිහිවූයේ අර්ධ වෛදික සමාජයක මිස අඩු තරමින් වෛදික සමාජයකවත් නො වෙයි. මෙරටට දඹදිවින් පැමිණියෝ අර්ධ වෛදිකයෝ වූහ. අසිත තවුසා මෙන් ම  සිදුහත් කුමරුගේ හා සිදුහත් තවුසාගේ ගුරුවරු අර්ධ වෛදිකයෝ වූහ. ඔවුහු ධ්‍යාන වැඩූහ. යෝග අභ්‍යාස කළහ. එමඟින් විමුක්තිය ලබාගැනීමට කටයුතු කළහ. එහෙත් වෛදිකයෝ එසේ නොවූහ. ඔවුහු බලි පූජා කළහ. සෝම පානය කළහ. බාහිර බලවේගයකට යාඥා කර විමුක්තිය ලබාගැනීමට උත්සාහ කළහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva